Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School



එම්.ඒ.රංජිත් මප/ විල් /ශ්‍රී ඥාණිස්සර
පිරිවෙන් විද්‍යායතනය හදුන්ගමුව මාතලේ

සතිය 29

**නිපුණතාව** -විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් නිර්මාණකරණයේ යෙදේ

**නිපුණතා මට්ටම** -විවිධ ද්‍රව්‍ය හා ශිල්ප ක්‍රම භාවිතා කරමින් සාම්ප්‍රදායික හැඩතල ප්‍රදර්ශන වන රංග ආභරණ සකස් කරයි

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

1. රංග ආභරණ නිර්මාණයේදී භාවිත අමුද්‍රව්‍ය වන්නේ

   1.කාඩ්බෝඩ් ,ලී කුඩු පල්ප,කම්බි  2. කාඩ්බෝඩ්, කතුරක්,පිහියක්

   3.කතුරක් ,කුඩා මිටියක් , කුඩා මුවහත් පිහියක්

   4. තීන්ත වර්ග ,ගම් වර්ග , පැන්සල්/ පෑන්  5.කපු පුළුන්, කුඩා පිහියක් ,කම්බි

2. සම්ප්‍රදායික රංග ආභරණයක් සැකැසීමේ දී අවධානය යොමු කළ යුතු කරුණ වන්නේ

   1.විහාර ,දේවාල හා පුරාවිද්‍යාත්මක සාධක වල දක්නට ලැබෙන රංග ආභරණ නිරීක්ෂණය

   2.අන්තර්ජාලයෙ ඇති රංග ආභරණ නිරීක්ෂණය

   3.පුවත්පත් සඟරා වල ඇති රංගාභරණ නිරීක්ෂණය

   4.වර්තමානයේ ලියවී ඇති පොත් පත් පරිශීලනය කිරීම

   5.රූපවාහිනී නාලිකා වල පලවෙන නර්තන අංග සඳහා භාවිත රංග ආභරණ නිරීක්ෂණය කිරීම

3.සාම්ප්‍රදායික අනන්‍යතාවය ප්‍රදර්ශනය වන පරිදි රංග ආභරණ කොටත් නිර්මාණය කිරීමේදී තුන්වන පියවර වන්නේ

   1. කම්බි යොදා සකස් කරගත් ආකෘතිය සවිමත් කිරීම සඳහා දෙපැත්තෙන් කඩදාසි ඇලවීම

   2. බොක්ස් බෝඩ් භාවිතා කරමින් රංග ආභරණ දළ සටහන හැඩ කැපීම

   3. අදාළ නිර්මාණ ආභරණයේ දළ සටහනක් නිර්මාණය කිරීම

   4 .කපාගත් හැඩතලයේ එක් පැත්තක බයින්ඩින් කම්බි වටේට යවා Stapler Clips මඟින් රැඳවීම

5. රතුපාට කපුරෙදි කැබැල්ලක් මත සකස් කරගත් හැඩය තබා අඟල් 1/2වටේට වැඩිපුර සිටින සේ රෙදි කැබැල්ල කපාගත යුතුය .පසුව ගම් ගා අලවා නියමිතය හැඩය සකස් කර ගැනීම

4. අධ්‍යාපනයේ රංග භාණ්ඩ නිර්මාණය කිරීමේදී අමුද්‍රව්‍ය වශයෙන් බහුලව යොදාගනු ලබන්නේ

   1.තහඩු  2. කපා හැඩ කරගත් වීදුරු කැබලි

   3. රබර් ෂීඩ්  4. අලංකාර පටි වර්ග  5.ලී වර්ග

5. ලී කුඩු පල්ප ආශ්‍රයෙන් නිර්මාණය කිරීමේදී කාඩ්බෝඩ් කොටස ආවරණය කිරීමට ........ අනිවාර්යෙන් අවශ්‍ය වේ

   1.ඇලෙන සුළු රෙද්දක්  2.කපු රෙදි කඩක්  3. පත්තර පිටුවක්

   4.විනිවිද පෙනෙන රෙදි කඩක්  5.එවැනිම කාඩ්බෝඩ් කොටසක්

**හිස්තැන් පුරවන්න.**

6. සම්ප්‍රදායික රංග භාණ්ඩයක් නිර්මාණය කිරීමේදී විහාර දේවාලවල ආශ්‍රිතව පවතින චිත්‍ර ,....................හා ....................... කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

7. රඟපාන්න නිර්මාණය කිරීමේදී කුඩා මුවහත් ....................... භාවිතා කිරීම ඉතාමත් වැදගත්ය .

8.ඉතා සියුම් කැබලි වලට කඩා ගත් කඩදාසි කෙම්පික්ස් ගම් හා පාන්පිටි මිශ්‍ර කර ........................ සකස් කරගත හැකිය .
9. ගැමි නැටුමකට උචිත රංග ආභරණයක් නිර්මාණය කිරීමේදී ඊට උචිත ...................... බැවින් යුක්තව නිර්මාණය කළ යුතුය .

10. රංග භාණ්ඩ නිර්මාණය කි10. රංග භාණ්ඩ නිර්මාණය කිරීමේදී පල්ප සකස් කිරීමේදී පාන් පිටි පාප්ප යොදා ගතහොත් ........................... අවශ්‍ය පමණ මිශ්‍ර කර ගත යුතුය .

**රචනා ප්‍රශ්න**

11.සම්ප්‍රදාම්ප්‍රදායික රංග භාණ්ඩ වල සුවිශේෂී ලක්ෂණ පිළිබඳ හැඳින්වීමක් කරන්න .

12. රංග ආභරණ නිර්මාණය කිරීම සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න .

13.රංග භාණ්ඩ නිර්මාණය කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න .